# ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

## 1. හැඳින්වීම.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 249 - 257 රීති දක්වා වන විධිවිධාන අනුව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය.

1.1 ස්ථාන මාරු සිදු කරන ආකාරය

ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම්වලට අවස්ථාව ලබා දීම සඳහා වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටු ලබා දෙන නිර්දේශ අනුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ක්‍රියාත්මක කෙරේ. ස්ථාන මාරු වීම් සඳහා සුදුසුකම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම්වලට අවස්ථාව ලබා දීම සඳහා හෝ ආයතන ප්‍රධානීන් විසින් පරිපාලනමය කරුණු අනුව කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කල නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට ද වාර්ෂික ස්ථාන මාරු කමිටුවට නිර්දේශ ලබා දිය හැකිය. මෙම මාරුවීම් වර්ෂයේ ආරම්භක වැඩ කරන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

## 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්

2.1 .මේ වන විට සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I/II/III ශ්‍රේණියේ නිලධරයන් අතරින් වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්,

2.1.1 යම් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන්.

2.1.2 පහසු සේවා ස්ථානයක වසර 03 ක සේවා කාලයක් හෝ දුෂ්කර සේවා ස්ථානයක වසර 02 ක කාලයක් සම්පූර්ණ කර ඇති කථිකාචාර්ය/ උපදේශක තනතුරු දරන නිලධාරීන් ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.1.3 අයදුම්කරුගේ තනතුරට අදාළ ක්ෂේත්‍රය මත පුරප්පාඩු පවතින ස්ථානයකට හෝ අදාල ක්ෂේත්‍රයේ අනුප්‍රාප්තිකයකු සහිතව හෝ පමණක් ස්ථාන මාරු සඳහා සලකා බලනු ලබන අතර අයදුම්කරුගේ තනතුරට අදාළ ශ්‍රේණිය සලකා බලනු නොලැබේ.

2.1.4 පහසු/දුෂ්කර සේවා ස්ථානයක උප විදුහල්පති, විදුහල්පති, නියෝජ්‍ය අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ තනතුරක වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු වීම් සඳහා සුදුසුකම් ලබයි.

මෙහිදී ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද II ශ්‍රේණියේ තනතුරු අතර ද (නියෝජ්‍ය අධ්‍යක්ෂ, උප විදුහල්පති) ස්ථාන මාරු වීම් සිදු කිරීමට සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද I ශ්‍රේණියේ තනතුරු අතර ද (අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ, විදුහල්පති) ස්ථාන මාරු වීම් සිදු කිරීමටද හැකියාව ඇත.



na

2.2 සෑම වසරකම දෙසැම්බර් 31 දින වන විට, තාක්ෂණ / කාර්මික විද්‍යාලයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති සියලුම නිලධාරීන් අයදුම් නොකළද වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

**2.3 සේවා ස්ථාන වර්ගීකරණය**

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ ස්ථාන මාරු පටිපාටියට යටත් වන නිලධරයන්ගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට (ඡන්ද හිමි නාමලේඛනයට අනුව) සේවා ස්ථානයට ඇති දුර ප්‍රමාණය අනුව පහත පරිදි සේවා ස්ථාන වර්ගීකරණය කරනු ලැබේ.

1. පහසු සේවා ස්ථාන: අදාළ නිලධරයාගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට ප්‍රවාහන පහසුකම්සහිත අඩුම දුර සැලකීමේදී 50km ක් ඇතුළත පිහිටි තාක්ෂණ / කාර්මික විද්‍යාල

2. දුෂ්කර සේවා ස්ථාන: අදාළ නිලධරයාගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට ප්‍රවාහන පහසුකම් සහිත අඩුම දුර සැලකීමේදී 50km ට වඩා වැඩි දුරක පිහිටි තාක්ෂණ/ කාර්මික විද්‍යාල

**3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පහත නිලධරයන්ගෙන් සමන්විත ස්ථාන මාරු මණ්ඩලය පත්කරනු ඇත.

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන)
2. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
3. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධාරීන් සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක්

**4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය හා ක්‍රියාකාරීත්වය**

4.1 වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව

1. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
2. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය)
3. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පරිපාලන)

4.2 ස්ථාන මාරු වීම් වලට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් ඉදිරිපත් කළ හැකි අවස්ථා ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් සලකා බැලීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර තීරණ ගනු ලැබේ.



nd

4.2.1 මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්

4.2.2 නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු නොවන අවස්ථා

4.2.3 නිලධරයන්ගේ ඉල්ලීම් වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්

## 5. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5.1 ස්ථාන මාරු කිරීමේදී මෙම පටිපාටිය යටතේ නිලධරයන්ගේ ස්ථාන මාරු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

5.2 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය. (උදා- 2025 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2024.12.31 දිනය)

5.3 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි.නමුත් නිලධරයාගේ පාලනයෙන් බැහැර කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු මණ්ඩලය ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරනු ලබයි.

5.4 ඉහත 2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එම සේවා ස්ථානයේ ඉහත 2.2 යටතට ගැනෙන නිලධරයන් අතුරින් නියමිත සේවා කාලය සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් ඇති නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

5.5 ඉහත 5.4 වගන්තිය යටතේ යම් ආයතනයක නියමිත සේවා කාලයකට වැඩි සේවා කාලයක් සහිත නිලධරයන් වෙනත් අයදුම්කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට හැකි වන සේ ස්ථාන මාරුවීම්වලට යටත් විය හැකි බැවින්, එවැනි නිලධරයන් මාරුවීමක් ලබාගැනීමට අපේක්ෂා නොකළද තමන් මාරු කරනු ලබන්නේ නම් මාරු වීමට කැමති ස්ථාන ආකෘති පත්‍ර අංක 01 හි අංක 05 යටතේ සඳහන් කළ යුතුය.

5.6 පහසු සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධරයෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් අනෙකුත් නිලධරයන්ට අසාධාරනයක් නොවන පරිදි එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේය.

5.7 සෑම විටම නිලධරයාගේ ඉල්ලීම් අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබාදීමට හැකි සෑම උත්සහයක්ම දරනු ඇත.

5.8 නිලධරයාට මෙන්ම තම පවුලේ අයටද, ඇති වන අපහසුතාවයන් අවම කිරීමට හැකිවන සේ ස්ථාන මාරුවක් ලබාදීමට ස්ථාන මාරු කමිටුවට පහසු වීම පිණිස නිලධරයන් විසින් තමා ඉල්ලා සිටින සේවා ස්ථානයට අමතරව තවත් විකල්ප ස්ථාන දෙකක් අනිවාර්යයෙන්ම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

5.9 දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි තාක්ෂණ/කාර්මික විද්‍යාලයන්හි සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන්ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන්ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

5.10 ස්ථාන මාරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු නිලධරයා හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

| සේවා ස්ථානය | අවුරුද්දකට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන සේවා ස්ථානයක් සඳහා උපරිම ලකුණු | අවම කාලයෙන් ඔබ්බට වූ ප්‍රථමවර්ෂය සඳහා උපරිම ලකුණු | අවම කාලයෙන් ඔබ්බට වූ දෙවන වර්ෂය සඳහා උපරිම ලකුණු | විවාහක/වැන්දඹු තත්වය සඳහා උපරිම ලකුණු | වයස අවුරුදු 18 ට අඩු දරුවන් සඳහා උපරිම ලකුණු | විශේෂ කරුණු උපරිම ලකුණු |
|---|---|---|---|---|---|---|
| පහසු | 1 | 2 | 3 | 2 | 3 | 4 |
| දුෂ්කර | 4 | 5 | 6 | 2 | 3 | 4 |

5.10.1 සේවා අවශ්‍යතාවය මත නිලධරයකු වෙනත් තාක්ෂණ/කාර්මික විද්‍යාලයකට ස්ථාන මාරු කර ඇත්නම්, ඔහුට අමතර ලකුණු 05ක් හිමිවේ. (විනය කරුණු හා නිලධරයාගේ ඉල්ලීම මත දෙනු ලබන මාරුවීම් සඳහා මෙම අනුග්‍රහය හිමිනොවේ.) නිත්‍ය සේවා ස්ථානයේ සිට සේවා අවශ්‍යතාවය මත තාක්ෂණ/කාර්මික විද්‍යාලයකට ස්ථාන ගත කරනු ලැබූ විට එකී කාලසීමාව ඔහුගේ නිත්‍ය සේවා ස්ථානයේ සේවා කාලයෙන් අඩු කරනු ලැබේ.

5.10.2 සේවා කාලයට මාස ගණනක් ඇතුලත් වන අවස්ථාවන්හී කිට්ටුම සම්පූර්ණ කරන ලද කාර්තුවකට 0.25 ක් ලකුණු දෙනු ලැබේ.

5.10.3 එකම සේවා ස්ථානයක් සඳහා ඉල්ලුම් කර ඇති වෙනත් සේවා ස්ථාන දෙකක සේවය කරන ලද නිලධරයන් දෙදෙනෙකුගේ ස්ථාන මාරුවකදී වැඩි ලකුණු ලබාගත් නිලධරයකු අඩු ලකුණු ලබාගත් නිලධරයකුගේ ඉල්ලීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ කැමැත්තට එරෙහිව මාරු කරනු ලැබූ විට වැඩි ලකුණු ලබා ගත් නිලධරයාට එතෙක් ලබා තිබූ ලකුණු ප්‍රමාණ ඊට පසු කරන සේවා කාලයට බලපාන ලෙස එකතු කරනු ලැබේ. (උදා:- වෛද්‍ය හේතූන් මත අඩු ලකුණු ලබා ගත් නිලධරයාට සහන සැලසීම සඳහා)

5.10.4 දරුවන් සඳහා ලකුණු ලබා දීමේදී වයස අවුරුදු 18 අඩු එක් දරුවකු සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 03කි.

5.10.5 විශේෂ කරුණු යටතේ නිලධාරියා/ නිලධාරිනිය හෝ ඔහුගේ/ඇයගේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ දරුවන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් වේ නම් එක් අයකු සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04ක් හිමිවේ.(අදාල තත්ත්වයන් රජයේ රෝහලකින් හෝ රජයේ ආයුර්වේද

රෝහලකින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික මගින් රෝගී තත්වය හා ලබාදිය යුතු සහනය සනාථ කළ යුතුය.)

5.10.6 පොළොන්නරුව, හසලක, දෙහිඅත්තකණ්ඩිය, මැදගම, මොණරාගල හා මන්නාරම කාර්මික විද්‍යාලවල සේවය කර ඇති නිලධරයෙකු සඳහා සේවය කර ඇති වසරකට ලකුණු 02 බැගින් ලකුණු ලබාදෙනු ලැබේ.

5.11.1 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශ ලේකම්ගේ අවසරය ඇතිව විශ්වවිද්‍යාලයක හෝ වෙනත් පිළිගත් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී අධ්‍යාපන පාඨමාලාවක් හදාරන අයට, ඒ සඳහා නියමිත අවම කාලය තුළ දැනට සිටින සේවා ස්ථානයේම රැඳී සිටීමට ඉඩ දෙනු ලැබේ. (අවම කාලය යනුවෙන් අදහස් කරන්නේ පාඨමාලාවේ නියමිත අවම කාලය වේ. විභාගයක් අසමත් වීමෙන් හෝ වෙනත් එවැනි හේතුවක් නිසා වැඩිපුර කාලයක් පාඨමාලාව හැදෑරීමට කිසිවෙකුට සිදුවුවහොත් එම වැඩිපුර කාලය සඳහා අනුග්‍රහය දෙනු නොලැබේ. එකම සේවා ස්ථානයක සේවය කරන කාලය තුළදී මෙම අනුමැතිය දෙනු ලබන්නේ එක් පාඨමාලාවක් හැදෑරීම සඳහා පමණි.) මෙය එක් වරක් විය යුතුය.

5.11.2 ශිෂ්‍යත්වයක් ලබා නිලධාරියකු දිවයිනෙන් බැහැර යන අවස්ථාවන්හි වැටුප් රහිතව සේවය කරන අවස්ථාවන්හි දී හා ද්විතියන පදනම මත නිදහස් කර ඇති අවස්ථාවන්හී දී ඉවත්ව ගිය දින සිට ලකුණු ක්‍රමය අක්‍රීය වනු ඇත. ආපසු දිවයිනට පැමිණි දින සිට නැවත ඔහුගේ ලකුණු ක්‍රමය ක්‍රියාත්මක වේ.

5.11.3 අනුමත කරන ලද පුහුණුවක් සඳහා පූර්ණ කාලීනව නිලධාරියකු නිදහස් කරන ලද විටක එම කාල සීමාව නිත්‍ය සේවා ස්ථානයේ කරන ලද සේවා කාලයෙන් අඩු කරනු ලැබේ.

5.12. නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු නැත්නම් මිස සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 53 ක් ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතු වුවත්, දිස්ත්‍රික්කය ඇතුළත ස්ථාන මාරු කිරීම් වලට යටත් වන්නේය.

5.13 යම් කිසි වෘත්තීය සමිතියක සභාපති/ ලේකම්/ භාණ්ඩාගාරික හා විධායක සභාවේ නිලයන් දරන නිලධරයන් මාරු කරන්නේ නම්, අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගත යුතුය. මෙම ස්ථාන මාරු කිරීම් කාර්ය පරිපාටියේදී වෘත්තීය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ ස්ථාන මාරු කමිටුවේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබන සංගමයන් වේ.

5.14 අයදුම්පත් කැඳවීමට පෙර මාරුවීමට යටත් නිලධරයන්ගේ ලැයිස්තුවක් හා ඇබෑර්තු පවතින කාර්මික විද්‍යාලවල ලැයිස්තුවක් සෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලයකටම හා ස්ථාන මාරු කමිටුවට සහභාගීවීමට සුදුසුකම් ලබන වෘත්තීය සමිතිවලට යැවිය යුතුය.

5.15 ජූලි මාසයේ 10 වන දිනයත්, දෙසැම්බර් මාසයේ 31 වන දිනයත් අතර කාලයේ දී සුහද ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් පත්‍ර භාර නොගත යුතුය.එහෙත් සේවා අවශ්‍යතා මත පමණක් ස්ථාන මාරුසලකා බැලීමට කටයුතු කළ හැකිය.(සේවා අවශ්‍යතා මත කරනු ලබන මාරුවීම් එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් විය යුතුය.)

5.16 ස්ථාන මාරුවීම ඉල්ලීමේදී (ආකෘති පත්‍ර 01 පරිදි) සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී (ආකෘති පත්‍ර අංක 04 පරිදි) සලකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි. ස්ථාන මාරු ඉල්ලුම් කරන ලද නිලධරයන් පිළිබඳ තොරතුරු ආකෘති පත්‍ර 02 මගින් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය . (මෙහිදී කථිකාචාර්ය/ උපදේශක තනතුරුවල විෂය ක්ෂේත්‍රයන් සඳහා වෙන් වෙන්ව සකස් කළ යුතු

අතර අධ්‍යක්ෂ/ විදුහල්පතිවරුන්ට අදාළ ආකෘති පත්‍ර අංක 02 දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සකස් කළ යුතුය.)

5.17 එක් සේවා ස්ථානයක වසර 03කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම නිලධරයන්ගේ වාර්තාවක් ආකෘති පත්‍ර අංක 03 මගින් සකස් කර එවීමට ආයතන ප්‍රධානීන් ඉතා වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුවේ.

5.18 සෑම නිලධරයකු පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු ඇති බව හෙළිදරව් වුවහොත් අදාළ ආයතන ප්‍රධානීන් එම ලැයිස්තු සකස් කළ අය හා එහි නිවැරදි බව පරීක්ෂා කර බලා තහවුරු කරනලද නිලධරයන් ඒ පිළිබද වගකීමට යටත් වේ.

5.19 ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයෝ, නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත වාර්තා කිරීමට බැදී සිටිති. නිලධරයකු වැඩ භාර ගැනීමෙන් පසු ආකෘති පත්‍ර අංක 06 මගින් ඒ බව අමාත්‍යාංශ ලේකම්ට පිටපත් සහිතව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

5.20 ස්ථාන මාරු නියෝග ලැබ සිටින නිලධරයකු එම මාරුවීම් ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදා නොහැරීම මාරු පටිපාටියට පටහැනිය. අදාළ ස්ථාන මාරු නියෝග පරිදි නව සේවා ස්ථානවල සේවය සඳහා අනිවාර්යයෙන්ම වාර්තා කළ යුතුය. ස්ථාන මාරු කමිටුව මගින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකිවන සේ මුදා හැරීමට කටයුතු කළ යුතුය. (ආකෘති පත්‍ර අංක 07 පරිදි) තාක්ෂණ/ කාර්මික විද්‍යාලවල අධ්‍යක්ෂ/ විදුහල්පතිවරුන් වර්ෂයේ පෙබරවාරි 01 දිනැතිව තම ආයතනයෙන් මුදාහරින ලද/නොලද සේවයට වාර්තා කළ/නොකළ නිලධරයන් පිළිබද විස්තර ආකෘති පත්‍ර 08 හා 09 යටතේ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්විය යුතුය.

6. වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු කාල සටහන

| | |
|---|---|
| අයදුම්පත් භාරදිය යුතු අවසාන දිනය | ජූලි මස 31 වන දිනට හෝ එදිනට පෙර |
| වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා අදාළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. | අගෝස්තු මස 31 වන දිනට හෝ එදිනට පෙර |
| වාර්ෂික ස්ථාන මාරු යෝජනා ලද පසු ස්ථාන මාරු දැන්වීම් නිකුත් කළ යුතු දිනය | සැප්තැම්බර් මස 15 වන දිනට හෝ එදිනට පෙර |
| වාර්ෂික ස්ථාන මාරු යෝජනා වලට අතෘප්තිමත් නිලධාරීන් සඳහා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 14 වන පරිශිෂ්ඨය අනුව එම ස්ථාන මාරුවට විරුද්ධව කරුණු දැක්වීම් ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලය | නිවාඩු දිනයන් ද ඇතුළුව දින 14කට වඩා නොවැඩි |
| වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත්කිරීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර |
| වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු විසින් අභිනියෝජිත බලධරයා වෙත නිර්දේශ ලබාදිය යුතු අවසාන දිනය | ඔක්තොම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර |
| වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කළ යුතු දිනය | නොවැම්බර් මස 01 වන දින හෝ එදිනට පෙර |
| වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කළ යුතු දිනය | ජනවාරි මස 01 දින |



rd

6.1 වාර්ෂික ස්ථාන මාරු චක්‍රයක ආකාරයකින් සිදු කරනු ලබන අතර ඉදිරියේදී කරනු ලබන බඳවා ගැනීම හෝ උසස්වීම් වලදී අනුප්‍රාප්තිකයන් ලබාදීම මත ස්ථාන මාරු සිදු කරනු නොලැබේ.

7. **වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර**

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ඡේදයේ 256 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව ස්ථාන මාරු නියෝගයකට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කල හැකිය. 256 වගන්තියේ අංක IV අනුව ස්ථාන මාරු නියෝගය නිලධරයා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත එම අභියාචනා ඉදිරිපත් කළ යුතුය.

**8.වෙනත් කරුණු**

**8.1 වාර්ෂික ස්ථාන මාරු වීම් පටිපාටියට පරිබාහිර අවස්ථා**

මෙම ස්ථාන මාරු වීම් පටිපාටියට පරිබාහිරව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I, II, ශ්‍රේණිවල නිලධාරීන්ගේ ඉල්ලීම් සහ සේවා අවශ්‍යතාවය අනුව ස්ථාන මාරුවීම් සිදු කිරීමට පහත සඳහන් පරිදි හැකියාව ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2183/20 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I, II ශ්‍රේණිවල තනතුරුවලට (උක්ත ගැසට් පත්‍රයේ අංක 11 වගන්තියේ සඳහන් තනතුරුවලට) විධිමත්ව පත් කරන ලද නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව සිදු කරනු ලබන ස්ථාන මාරුවීම්.

8.1.1 මෙවැනි ඉල්ලීම් අදාල සේවා අවශ්‍යතාවය සහ නිලධාරියාගේ ඉල්ලීම සලකා බලා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය සහිතව රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල යුතුය. ඒ අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එම කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. මෙහිදී ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද II ශ්‍රේණිවල තනතුරු අතර ද (නියෝජ්‍ය අධ්‍යක්ෂ, උප විදුහල්පති) , I ශ්‍රේණිවල තනතුරු අතර ද (අධ්‍යක්ෂ , අතිරේක අධ්‍යක්ෂ, විදුහල්පති) ස්ථාන මාරු වීම් සිදු කිරීමට ද හැකියාව ඇත. තවද සුහද ස්ථාන මාරුවීම් සඳහා ද ඉහත දැක්වෙන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක නිර්දේශය ලබා ගැනීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වග බලා ගත යුතු ය.

1.කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

(පරිපාලන හා මූල්‍ය)

2.කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(අධ්‍යයන)

3.අදාළ රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු

සකස් කළේ :
අත්සන : ..................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ..................................
පරිපාලන නිලධාරී (වැ.ආ)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
දිනය : 2026.01 කොළඹ 10

පරීක්ෂා කළේ:
අත්සන : ..................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ..................................
තනතුර : ....බී.ජී.එම්.ඩී. බාලසූරිය
දිනය : ........අධ්‍යක්ෂ (පරිපාලන) - II
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ: 557, ඕල්කට් මාවත, කොළඹ 10.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.
අත්සන : ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : .................ටී.බාබු
අධ්‍යක්ෂ ජනරාල්
තනතුර : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
දිනය : ......තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10.

යොමු අංකය : ..................................

2025.09.16 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ තනතුර/තනතුරු සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..................................
නම : ..................................
අමාත්‍යාංශය; ..................................
දිනය : 2026/02/12

නීල මුද්‍රාව : ..................................

නාලක කළුවැව
ලේකම්
උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

යොමු අංකය : ..................................

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ තනතුර/තනතුරු සඳහා යෝජිත මෙම වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය ..................................දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..................................
නම : ..................................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දිනය : 2026.4.22

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දසනායක
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

නීල මුද්‍රාව : ..................................

ආකෘති පත්‍ර අංක 01

ස්ථාන මාරු අයදුම්පත

( ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I,II හා III ශ්‍රේණිවල නිලධාරීන් සඳහා)

1. පෞද්ගලික තොරතුරු

1.1 නම (පත්වීමේ ලිපියේ පරිදි) : ..........................................................................
..........................................................................................................

1.2 නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ..........................................................
..........................................................................................................

1.3 සම්පූර්ණ නම : ..........................................................................................
..........................................................................................................

1.4 .................................. දිනට වයස : ..........................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................

1.6 මුල්පත්වීම් දිනය : ..................................................................................

1.7 ස්ථිර පෞද්ගලික ලිපිනය : ..........................................................................
..........................................................................................................

1.8 දුරකථන අංකය : නිවස : ......................................... ජංගම : .......................................

1.9 විවාහක/අවිවාහක/වැන්දඹු බව : ..................................................................

1.10 විවාහක නම්, කලත්‍රයා රැකියාවක් කරන්නේ නම්,

I. ඔහුගේ/ඇයගේ නම ..................................................................................
II. සේවා ස්ථානය හා ලිපිනය : ..........................................................................
III. දරන තනතුර..........................................................................................
IV. සේවා යෝජකයාගේ නම/ලිපිනය/දුරකථන අංකය : ..................................................
..........................................................................................................

1.11 වයස අවුරුදු 18ට අඩු දරුවන් පිළිබඳ විස්තර

| | නම | වයස | ඉගෙනුම ලබන පාසල | පන්තිය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |



na

2. වර්තමාන සේවා ස්ථානය

2.1 තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ නම.......................................................................................

2.2 වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ දිනය : ...............................................

2.3 වර්තමාන සේවා ස්ථානයට පැමිණීමට හේතුව (√ ලකුණ යොදන්න)

01. නව පත්වීමක් ලැබීම මත ☐ 3. සේවා අවශ්‍යතාවය මත ☐

02. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත ☐ 4. විනය හේතුවක් මත ☐

05. වෙනත් ..........................................................................................................

2.4 ස්ථිර පදිංචි ලිපිනයේ සිට සේවා ස්ථානයට අවම දුර කිලෝමීටර් : ...............................

3. තනතුර

3.1 වර්තමාන තනතුර නාමය : ..........................................................................................

(කථිකාචාර්ය/උපදේශක නම් අදාළ ක්ෂේත්‍රය සමග)

3.2 භාෂා මාධ්‍යය : ..........................................................................................................

3.3 එම තනතුරට පත්වූ දිනය : ..........................................................................................

3.4 වර්තමාන තනතුරෙහි සේවා විස්තරය

| | ආයතනය | සිට | දක්වා | කාලය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |

4.ස්ථාන මාරු ඉල්ලීමට හේතුව : ..........................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................



rd

5. ස්ථාන මාරුවක් අපේක්ෂා කරන්නේද ? නැද්ද වග : ...............................................................

අපේක්ෂිත තාක්ෂණ/කාර්මික විද්‍යාල 03න් ප්‍රමුඛතාවය අනුව සඳහන් කරන්න.

| | අපේක්ෂා කරන සේවා ස්ථාන |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

6. වෘත්තීය සමිති නිලයක් දරන්නේ නම්,
   6.1 වෘත්තීය සමිතියේ නම : ...............................................................................................
   6.2 දරන තනතුර : ..........................................................................................................
   6.3 වෘත්තීය සමිති අනුග්‍රහ ලැබූ කාලසීමාවන් : .........................................................................

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය බවට සහතික කරමි.අසත්‍ය තොරතුරු ලබාදී ඇති බව සනාථ වුවහොත් විනයානුකූල දඬුවමකට යටත් බවද දනිමි.

දිනය : ........................................ ........................................

අයදුම්කරුගේ

අත්සන

ඉහත සඳහන් තොරතුරු පෞද්ගලික අනුගොනුව අනුව නිවැරදි බව සහතික කරන අතර මෙම නිලධාරියා අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව ස්ථාන මාරු කිරීම නිර්දේශ කරමි.

දිනය : ........................................ ........................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

ආකෘති පත්‍ර අංක 02

<u>ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සෙවයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය - ................................වර්ෂය</u>

තාක්ෂණ/කාර්මික විද්‍යාලය : ...........................................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය | පත්වීම් දිනය හා මාධ්‍ය | තනතුර (කථිකාචාර්ය උපදේශක නම් ක්ෂේත්‍රය සමඟ | ස්ථිර පෞද්ගලික ලිපිනය | උපන්දිනය හා ................ දිනට වයස | විවාහක/ අවිවාහක බව- කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුවන් සංඛ්‍යාව | ස්ථිර ලිපිනයේ සිට සේවා ස්ථානයට ආසන්නතම දුර | මාරුවීම් ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති ස්ථාන | මාරු කමිටුවේ තීරණය (කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

සියළුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : ..........................     අත්සන : ..........................

පරීක්ෂා කළේ : ..........................     අත්සන : ..........................

දිනය : ..........................

......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

ආකෘති පත්‍ර අංක 03

<u>එක් සේවා ස්ථානයක අවුරුදු 03කට වඩා වැඩිකාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර</u>

<u>(වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.)</u>

තාක්ෂණ/කාර්මික විද්‍යාලය : ....................................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න) | පත්වීම් දිනය හා මාධ්‍ය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර (කථිකාචාර්ය උපදේශක නම් ක්ෂේත්‍රය සමඟ) | උපන්දිනය හා ................ දිනට වයස | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය ..................... දිනට | විවාහක/ අවිවාහක බව - කලත්‍රයාගේ සේවා ස්ථානය | පාසල් යන දරුවන් පිළිබඳ විස්තර | ස්ථිර ලිපිනය | මුල් පත්වීමේ සිට සේවා ස්ථාන හා කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

සියළුම නිලධාරීන්ගේ ඉල්ලුම්පත් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ : ..........................  අත්සන : ..........................

පරීක්ෂා කළේ : ..........................  අත්සන : ..........................

දිනය : ..........................

.......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

ආකෘති පත්‍ර අංක 04

ඔබේ අංක : ..................................
නම : ..............................................................
තනතුර :..........................................................
ලිපිනය : .........................................................
දිනය :.............................................................. මඟින්
(පත් කිරීම් බලධරයා)
..........................................................

<u>යෝජිත වාර්ෂික ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම</u>

ඔබගේ අංක .............................................................. හා ...................................................... දිනැති
ලිපිය/යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛණය මගින් මා ..............................................................ට
ස්ථාන මාරු කිරීමට යෝජිත බව දක්වා ඇත.

02. පහතින් විස්තර කරණු ලබන කරුණු මත එම යෝජිත ස්ථාන මාරුව අවලංගු කරන ලෙස/සංශෝධනය කරන ලෙස/නැවත සකසා බලන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයෙහි 209 වන වගන්තිය ප්‍රකාරව ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2.1. ..............................................................................................................................
..............................................................................................................................

2.2. ..............................................................................................................................
..............................................................................................................................

2.3. ..............................................................................................................................
..............................................................................................................................

03. ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමඟ යා කර ඇත.
.....................................................................................................................................

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබා දෙන ලෙසද ඉල්ලමි.
පළමුවන මනාපය .....................................................
දෙවන මනාපය .....................................................
තුන්වන මනාපය .....................................................

අත්සන
පිටපත් :-
1. පත්කිරීම් බලධරයා
2. දෙපාර්තමේන්තු ප්‍රධානි
3. ආයතන ප්‍රධානි

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය
(පත් කිරීම් බලධරයා)
..........................................................
.......................................................... විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමට පත් වෙමි./පත් නොවෙමි. ඉල්ලීම ඉටු කිරීම නිර්දේශ කරමි/නොකරමි.

අත්සන : ..........................................
නම : ..........................................
තනතුර : ..........................................
නිල මුද්‍රාව : ..........................................

දිනය : .................................................



nd

ආකෘති පත්‍ර අංක 05

මුලකුරු සමඟ නම : ......................................

ලිපිනය : ....................................................

.............................................................

දිනය : .......................................................

දෙපාර්තමේන්තුව ප්‍රධානී මඟින්

............................................................

(අමාත්‍යාංශ ලේකම්) මඟින්

............................................................

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

............................................................

..........................................................................................................

<u>පත්කිරීම/උසස් කිරීම/ස්ථාන මාරු කිරීම සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනය</u>

1. අභියාචනය පිළිබඳ විස්තර
   - 1.1. සම්පූර්ණ නම : ..............................................................................................
   - 1.2. අයත් වන සේවය : ......................................... පන්තිය : ................ ශ්‍රේණිය : .....
   - 1.3. තනතුර : ..............................................................................................
   - 1.4. සේවා ස්ථානය : ......................................................................................
   - 1.5. දෙපාර්තමේන්තුව : ..................................................................................
   - 1.6. අමාත්‍යාංශය : .......................................................................................
2. අභියාචනයට පදනම්ව ඇති තීරණය/නියෝගය පිළිබඳ විස්තර
   - 2.1. තීරණය/නියෝගය කුමක්ද? යන වග සැකෙවින්

     ..............................................................................................................

     ..............................................................................................................
   - 2.2. තීරණය/නියෝගය දෙන ලද්දේ කා විසින්ද?

     ..............................................................................................................

     ..............................................................................................................
   - 2.3. තීරණය/නියෝගය නිලධරයාට ලැබුණු දිනය : ..................................................
   - 2.4. තීරණය/නියෝගය දැක්වෙන ලිපිවල සහතික කළ පිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

     ඇමුණුම 01 ....................................................

     ඇමුණුම 02 ....................................................



ℛa

2.5. අදාළ වෙනත් කරුණු

......................................................................................................................................

......................................................................................................................................

3. තීරණ/නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු :

3.1. ......................................................................................................................................

......................................................................................................................................

3.2. ......................................................................................................................................

......................................................................................................................................

3.3. ......................................................................................................................................

......................................................................................................................................

3.4. ......................................................................................................................................

......................................................................................................................................

3.5. ......................................................................................................................................

......................................................................................................................................

3.6. මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම 01 .....................................................

ඇමුණුම 02 .....................................................

4. ඉල්ලා සිටිනු ලබන සහන :

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

............

අත්සන : ..........................................

නම : ..........................................

තනතුර : ..........................................

දිනය : ..........................................

ප්‍රගමන පිටපත : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආකෘති පත්‍ර අංක 06

නම : ................................................

සේවා ස්ථානය : .................................
........................................................
දිනය : ...............................................

.................................................... මඟින්
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

<u>නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීම</u>

................. වසරේ ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ................ (මුදා හරින ලද දිනය) දින සිට සේවයෙන් මුදා හරින ලද මා ...........................(සේවයට වාර්තා කළ දිනය) දින .................................................................. (සේවා ස්ථානය) සේවයට වාර්තා කළ බව මෙයින් කාරුණිකව දන්වමි.

මෙයට, විශ්වාසී,
අත්සන : ...........................................................
තනතුර : ...........................................................
ශ්‍රේණිය : ...........................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ...................................

සේවයට වාර්තා කළ බව තහවුරු කරමි.

දිනය : ........................................ ......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

පිටපත්
.........................................................................................................
අමාත්‍යාංශය



na

ආකෘති පත්‍ර අංක 07

මාගේ අංකය : ......................................

තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ නම : ........
.............................................................

දිනය : ..................................................

.......................................................... මහතා/මිය/මෙනෙවිය
තනතුර : ..........................................................................

<u>වාර්ෂික ස්ථාන මාරු ලැබීම මත සේවයෙන් මුදා හැරීම</u>

...................... වසරේ ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඔබව ........................................................................ (නව සේවා ස්ථානය) වෙත සේවයට වාර්තා කළ හැකි වන පරිදි .......................... (මුදා හරිනු ලබන දිනය) දින සිට සේවයෙන් මුදා හරින බව කාරුණිකව දන්වමි.

.................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව

පිටපත් :

1. ...................................................................................අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව



nd

**ආකෘති පත්‍ර අංක 08**

.................................................. තාක්ෂණ/කාර්මික විද්‍යාල වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්

සේවය : ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය

| | නම | තනතුර (කථිකාචාර්ය උපදේශක නම් ක්ෂේත්‍රය සමඟ | පෙර සේවා ස්ථානයෙන් මුදා හරින ලද දිනය | නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කළ දිනය | ආකෘති පත්‍ර අංක 06 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබේද? |
|---|---|---|---|---|---|
| | | | | | |

nd

ආකෘති පත්‍ර අංක 09

...................................................... තාක්ෂණ/කාර්මික විද්‍යාල වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්

සේවය : ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවය

| | නම | තනතුර (කථිකාචාර්ය උපදේශක නම් ක්ෂේත්‍රය සමඟ | ස්ථාන මාරු ලද සේවා ස්ථානය | මුදාහරින ලද දිනය | ආකෘති පත්‍ර අංක 06 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබේද? |
|---|---|---|---|---|---|
| | | | | | |



ගල